"මෙම කොවිඩ්-19 තත්වය ජනමනසට ආතතිය සහ ඉච්ඡාභංගත්වය ඇති වන ලෙසින් නොව, අනාගතය සම්බන්ධයෙන් ධනාත්මක බලාපොරොත්තු සහ එකිනෙකා අතර සහයෝගය ඇති වන ලෙස ප්‍රවෘත්ති සහ දැනුවත් කිරීම් ලබාදෙන්න" යනුවෙන් සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය මගින් කොවිඩ්-19 වාර්තාකරණය සඳහා හඳුන්වා දී ඇති නිර්දේශ මාලාවේ දැක්වේ.

මෙම නිර්දේශයට අනුගතව කොවිඩ්-19 පිළිබඳව වාර්තා කිරීම වැදගත් වන්නේ, ඒ ඔස්සේ කොවිඩ්-19 කෙරෙහි මෙන්ම කොවිඩ්-19 වසංගතයෙන් පොදුවේ සිදුවන බලපෑම කෙරෙහිත් ආතතියක් සහ ඉච්ඡා භංගත්වයක් ඇතිවීම වැළැක්විය හැකි වීම නිසා පමණක් නොවේ. ඒ ඔස්සේ, කොවිඩ්-19 පිළිබඳව ඇතිවන බිය ඔස්සේ ආසාදිතයින් සහ නිරෝධායනයට ලක් කර සිටින්නන් කෙරෙහි අනියත බියක් ඇති කර ගැනීම සහ ඔවුන්ව ඒ ඔස්සේ කොන් කිරීමද වැළකෙනු ඇත.

කෙසේ වෙතත් මාධ්‍ය මෙම නිර්දේශයන් කෙතරම් දුරට පිළිපදින්නේද යන්න ගැටළුවකි. "රට පුරා පැතිරුණු කොවිඩ් ගිණි පුපුරු", "අම්පාර පොළෙත් කොරෝනා බියක්" වැනි සිරස්තල සහිත පුවත් මෙම නිර්දේශය හා අනුගත වන්නේ යැයි ඔබ සිතන්නේද?

අදාළ නිර්දේශ මාලාව වෙත ප්‍රවේශය: [https://mcusercontent.com/.../6a771830-d3bd-456e-8fbf...](https://mcusercontent.com/.../6a771830-d3bd-456e-8fbf...)

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #SinhalaNews #NewsPapers #Coronavirus #Aruna #Silumina**